## ප්‍රධාන නිර්දේශයන්

### රාජ්‍ය සහන

**සමීප පරාස සංනිවේදන තාක්ෂණය** උපයෝගී කරගනිමින් ජංගම දුරකතනයන් හෝ සිම්පත් හරහා පොදු ප්‍රවාහන පහසුකම් වලට **සචල ටිකට්පත්** හඳුන්වා දිය හැකිය. මහා ජනතාවට මෙමගින් ලැබෙන ප්‍රතිලාභ සලකා බලා සචල ටිකට්පත් ක්‍රමය හඳුන්වා දීම සඳහා අවශ්‍යවන උපකරණ තීරු බදු රහිතව ආනයනය කිරීමට අවසර දීම වැනි සහන රජය විසින් සලසා දිය යුතුය.

### නියාමකයන්ගේ කාර්යභාරය

දැනට ලෝකයේ අනෙකුත් රටවල සමීප පරාස සංනිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කරනු ලබන්නේ බලපත්‍ර රහිත සංඛ්‍යාත කලාපයක් ප්‍රයෝජනයට ගනිමිනි. මෙම තාක්ෂණය, විශේෂයෙන්ම මහා පරිමාණයෙන්, උපයෝගී කරගන්නේ නම් ඒ හා බැඳුනු බලපත්‍ර ගැටළු විසඳීමට විදුලි සංදේශ නියාමකයාට සිදුවනු ඇත. සචල ටිකට්පත් සංකල්පයට ව්‍යාපාරික තිරසාර බවක් ලබාදීමට නම් ජංගම ගෙවීම් සම්බන්ධ කටයුතු වැනි මූල්‍ය කටයුතු පිළිබඳ ගැටළු තැන් බැංකු කටයුතු නියාමකයා විසින් පැහැදිලි කරදිය යුතුය.

### ආකල්ප වෙනස් කිරීම

දැනට ජනතාව තුල පවතින ආකල්පය නම් ප්‍රවාහන ප්‍රවේශපත්‍ර මිලදී ගැනීම උදෙසා ජංගම දුරකතනය යොදාගැනීම කරදර සහිත කාර්යයකි යන්නයි. ඒ හැරුණුවිට සැබෑ මුදල් නොවන මුදල් වර්ගයක්, මිලදී ගැනීම සඳහා යොදාගැනීම ශ්‍රී ලංකාවට ආගන්තුක සංකල්පයකි. එබැවින් සචල ටිකට්පත් ක්‍රමය හඳුන්වා දුන් පසුව ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම ඔවුන් ඒ කෙරෙහි යොමුකිරීම සඳහා ද කිසියම් දිරිගැන්වීම් ලබා දීම අවශ්‍ය වනු ඇත.

---

### ශ්‍රී ලංකාවේ බස් මගී ප්‍රවාහනය

දැනට රටතුල පොදු මගී ප්‍රවාහන කටයුතු වලින් 93% ක්ම සිදුකරනු ලබන්නේ බස්රථ මාර්ගයෙනි. බස් ප්‍රවාහන සේවා වලින් වැඩි කොටස පෞද්ගලික අංශය සතුව පවත්නා අතර රාජ්‍ය බස් සේවයක් ද ක්‍රියාත්මකය. දිනපතා මගීන් මිලියන 10 ක් බස් රථ 18,000 ප්‍රයෝජනයට ගනිමින් ගමන් බිමන් යතැයි ගණන් බලා තිබේ.

### ප්‍රවේශපත් ලබා දීමේ ක්‍රම

පොත් සහ අතින් ක්‍රියාත්මක කෙරෙන යන්ත්‍ර යොදා ගනිමින් රාජ්‍ය බස් සේවයේ ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. බොහෝ පෞද්ගලික බස් හිමියන් මේ වනවිට සිය බස්රථ සඳහා දත්ත ගබඩා කිරීමේ සහ පැසුරුම් කිරීමේ හැකියාවෙන් යුත් ඩිජිටල් යන්ත්‍ර මේ සඳහා යොදවා තිබේ. යන්ත්‍රවල මෙම අතිරේක හැකියාව බස් හිමියන් ට ප්‍රයෝජනවත් දත්ත පසුව ලබා ගැනීමේ අවසථාව ලබා දෙයි.

### දැනට පවත්නා ක්‍රමයේ ගැටළු

බස් හිමියන්ගේ පාර්ශවයෙන්

- රාජ්‍ය බස් - දෛනික ආදායමෙන් 15% ක් අතරමගදී අහිමිවේ
- පෞද්ගලික බස් - දෛනික ආදායමෙන් 25% ක් අතරමග දී අහිමිවේ.

ආදායම අහිමිවන ක්‍රම

අ) බස් කොන්දොස්තරවරුන් විසින්, සමහරවිට රියදුරන් ගේ ද අනුදැනුම සහිතව, ආදායමෙන් කොටසක් අතරමගදී ඉවත් කරගනු ලැබීම.

ආ) සමහර මගීන් ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමෙන් තොරව ගමන් කිරීම. සමහර අවස්ථාවල මගියාගේ පාර්ශවයෙන් මෙය හිතා මතා සිදු කරනු ලබයි. දැනට පවත්නා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමය නිසා කෙටිදුර ගමන් කරන මගීන්ට, විශේෂයෙන් ම දවසේ මගීන් අධික කාලපරිච්ඡේද වලදී, ටිකට් පත් මිලදී ගත නොහැකිවේ.

ඇ) මගීන් හිතා මතා තමන් ගෙවූ මුදල ට වඩා වැඩි දුරක් ගමන් කිරීම.

එසේහෙයින් සේවා සපයන්නාගේ පාර්ශවයෙන් ගත් කල වඩා සුරක්ෂිත, ඉක්මන් ගනුදෙනුවක් සිදුකිරීම සහ අයථා මාර්ග ඔස්සේ මුදල් අහිමිවීම වලකාගැනීමේ නිසග අවශ්‍යතාවයක් පවතී.

මගියාගේ පාර්ශවයෙන් ගත් කල ඔහුට බොහෝ අවස්ථාවලදී ඉතිරි මුදල් නොලැබේ. මෙහි ප්‍රතිඵලය වනුයේ කිසියම් ගමනකට නියමිත ගාස්තුවට වඩා වැඩි මුදලක් ගෙවීමට ඔහුට සිදුවීමයි. එනයින් බලන කල නියමිත ගාස්තුව මාරුකාසිවලින් ගෙනයාම අනිවාර්ය නොවන, වඩා කාර්යක්ෂම ප්‍රවේශපත්‍ර ක්‍රමයක අවශ්‍යතාවයක් මගී පාර්ශවයෙන් ද පවතී. මගීන් මුහුණදෙන තවත් ගැටළුවක් වනුයේ තමන් විසින් ඉවත්කර ගනුලබන මුදල් පියවීම සඳහා කොන්දොස්තරවරන් විසින් පමණට වඩා වැඩි මගීන් සංඛ්‍යාවක් බස්රථවලට නංවා ගැනීමයි.

**ස්වයංක්‍රීය ප්‍රවේශපත් නිකුත් කිරීම**

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන සේවය තුල ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයන් දෙකක් සලකා බලනු ලබයි.

1. *ස්පර්ශයෙන් තොර ස්මාර්ට් කාඩ්පත්* - දත්ත ගබඩාකිරීම සහ පැසුරුම් කිරීමේ හැකියාවෙන් යුත් ඇතුලට එබ්බවූ අනුකලිත පරිපථයක් සහිත සහ ගුවන්විදුලි තරංගමාලා ඔස්සේ කාඩ් කියවනය සමග සම්බන්ධවිය හැකි කාඩ්පත්.
2. *ජංගම දුරකතන* - සමීප පරාස සංනිවේදනය අඩංගු කරන ලද ජංගම දුරකතන උපකරණ හෝ සිම්පත් යොදාගනිමින් ජංගම දුරකතනය ඉහත දැක්වූ ස්මාර්ට් කාඩ්පතට සමාන මෙවලමක් බවට පත්කල හැක. ජංගම දුරකතනය සහ ටර්මිනලය අතර සම්බන්ධතාවය ඇති කෙරෙනුයේ කෙටිදුර ගුවන් විදුලි තරංගමාලා හරහාය.

   සටහන - කෙටි පණිවිඩ යොදාගනිමින් කෙරෙන ගෙවීම් අසීරුය. මෙය එක් විකල්පයක් වුව ද බස් ප්‍රවේශපත්‍ර සඳහා විකල්පයක් ලෙස සලකනු නොලැබින. බස් ප්‍රවේශ පත්‍ර සඳහා ජංගම දුරකතන භාවිතය වඩාත් ආරක්ෂිත වනුයේ ප්‍රවේශ පත්‍රය සඳහා දුරකතන හිමිකරු අවසරදීම අවශ්‍යවන හෙයිනි. ස්මාර්ට් කාඩ්පත යොදාගැනීමේදී කාඩ්පත කාඩ් කියවනය සමීපයට පැමිණි වහාම හිමිකරුගේ අවසරයෙන් තොරව මුදල් අඩු කරයි. අවශ්‍ය වුවහොත් ගනුදෙනුව නැවැත්වීම සඳහා හිමිකරුට අවස්ථාව නොලැබේ. මෙම ආකාරයේ ප්‍රවේශපත්‍ර වංචනිකව යොදාගැනීමේ ඉඩකඩ පවතී.

**අභියෝග සහ ප්‍රතිලාභ**

*පරිවර්තන පිරිවැය* - ඉහත ක්‍රම දෙකින් කවරක් තෝරාගනු ලැබුවද අතින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරන වර්තමාන ක්‍රමයේ සිට එම ක්‍රමය දක්වා පරිවර්තනය කිරීම සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතු වනු ඇත. දැනට පෞද්ගලික බස්කරුවන් විසින් පාවිච්චි කරනු ලබන ඩිජිටල් ටිකට් යන්ත්‍රයේ ක්ෂුද්‍ර පෙත්ත උසස් කිරීමෙන් පමණක් ස්මාර්ට් කාඩ් සඳහා යොදා ගත හැකිය. කෙසේ වුවද ස්මාර්ට් කාඩ් නිෂ්පාදනය සඳහා සහ

බෙදාහැරීම සඳහා දරන්නට සිදුවන විශාල පිරිවැය ද සැලකිල්ලට ගතයුතු කරුණකි. ජංගම දුරකතන විකල්පය යොදාගතහොත් බස්හිමියාගේ පාර්ශවයෙන් දරන්නට සිදුවන්නේ කියවනයක පිරිවැය පමණකි. මගියාගේ පැත්තෙන් දුරකතන උපකරණයෙහි හෝ සිම්පතෙහි දෘඩාංග උසස් කිරීමක් අවශ්‍ය වේ.

*තාක්ෂණය ලබාගැනීම* - බස් ප්‍රවේශපත්‍ර සඳහා ජංගම දුරකතන යොදාගන්නේ නම් දුරකතනය හෝ සිම් කාඩ්පත සමීප පරාස සංන්නිවේදනය සමග අනුකූල කල යුතුය. අළුතෙන් නිෂ්පාදනය කෙරෙන ජංගම දුරකතන උපකරණ බොහොමයක් මෙකී තාක්ෂණය සහිතව නිපදවෙන නමුත් සිම්පතට ආරක්ෂිත පෙත්ත ඇතුළු කිරීම වඩාත් පලදායී ක්‍රමයයි. නමුත් දැනට පවතින සිම් පත් වල මේ සඳහා අතුරු ස්ථානයක් නොපවතී. එබැවින් සමීප පරාස සංනිවේදනය සක්‍රීය කිරීමට ඉඩකඩ පවතින පරිදි සිම්පත් ප්‍රමිතිකරණය කිරීම මේ තාක්ෂණය යොදාගැනීම සීඝ්‍ර කිරීමට හේතු සාධක වනු ඇත.

*සියළුදෙනාම ජංගම දුරකතන භාවිත නොකිරීම* - බස් ප්‍රවේශපත්‍ර සඳහා ජංගම දුරකතන භාවිත කිරීම සලකා බලන ලද්දේ සියළුම බස් මගීන්ට ජංගම දුරකතන හිමිකම පවතී යන උපකල්පනය මත පිහිටා ගෙන වුවත් යථාර්ථය මෙය නොවේ. බස් මගීන්ගෙන් බොහෝ දෙනෙක් ජංගම දුරකතන පාවිච්චි කල ද එසේ නොකරන්නන් සඳහා විකල්ප ප්‍රවේශ පත් නිකුත් කිරීමේ ක්‍රමයක් අවශ්‍යවේ. ස්මාර්ට් කාඩ් ක්‍රමය භාවිතා කරන්නේ වුව ද විකල්ප ක්‍රමයක් පැවතීම අත්‍යවශ්‍ය වනු ඇත.

*වෙනස්වීම කළමණාකරණය කිරීම* - ශ්‍රී ලංකාවේ දිනපතා ගමන් කරන බස් මගීන් අතර කරන ලද සමීක්ෂණයකදී අනාවරණය වුයේ ඔවුන් බස් ප්‍රවේශපත් සඳහා ස්මාර්ට් කාඩ් ක්‍රමය වඩා ප්‍රියකරන බවයි. දැනට පවතින හඬ නොවන ජංගම දුරකතන සේවා සමග ඈඳී ඇති ගැටළු මෙම ආකල්පයට ප්‍රධාන හේතුව වී තිබේ. වර්තමානයේ සේවාවක් ලබා ගැනීමට නම් කෙටි පණිවිඩයක් යැවීම හෝ ඇමතුමක් දීම අත්‍යවශ්‍ය වන අතර ඒ සඳහා වැඩි ගාස්තු ගෙවීමට සිදුවේ. එහෙයින්, ජංගම දුරකතන හරහා බස් ප්‍රවේශපත් නිකුත් කිරීමට තීරණය කළහොත් ජනතාව තුල ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා සහ එම ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා සැලකිය යුතු ආයෝජනයක් කිරීම අවශ්‍ය වනු ඇත. අනෙක් අතට මුදල් ගනුදෙනු වල සිට මුදල් රහිත ගනුදෙනු දක්වා යන මේ ක්‍රමයට බස් කොන්දොස්තරවරුන්ගේ විරෝධතාවය එල්ලවීමට ඉඩ තිබේ. ඔවුනට කොමිස් ලබා දීම වැනි දිරිගැන්වීමේ ක්‍රමයක් හරහා මේ විරෝධතා ජය ගැනීමට ක්‍රියා කල හැක.

*පෞද්ගලිකත්වය පිළිබඳ ගැටළු* -

බස් ප්‍රවේශපත් සඳහා ස්මාර්ට් කාඩ් හෝ වේවා ජංගම දුරකතන හෝ වේවා කවර ආකාර වූ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් භාවිත කිරීමේ දී වුවද මතුවන තවත් ගැටළුවක් තිබේ. එනම් සේවා සපයන්නාට මගියා ගේ ගමන් බිමන් පිළිබඳව දැනගත හැකි වීමයි. පුද්ගලයකුගේ පෞද්ගලිකත්වය උල්ලංඝනය වෙතැයි යන අදහස මෙහිදී ගම්‍ය විය හැකි හෙයින් ඒ පිළිබඳව ද අවශ්‍ය පියවර ගත යුතු වනු ඇත.

මෙබඳු ක්‍රමයක ප්‍රතිලාභ සමස්ත ආර්ථිකය පුරා විහිද යන බව පැහැදිලිය. ස්වයංක්‍රීය ක්‍රමය තුලින් බස්රථ හිමියනට සිය ආදායම ඉහත දැක්වූ විවිධ ක්‍රම ඔස්සේ අහිමිවීම නවතා ගැනීමට හෝ පාඩුව අවම කරගැනීමට හැකිවේ. මගියාට අතිවිශාල පහසුවක් ඉලෙක්ට්‍රොනික ටිකට් පත් විසින් ලබා දෙනු ඇත. සිය ආදායම් වැඩි කර ගැනීමට බස්රථ හිමියනට මෙන්ම ජංගම දුරකතන සේවා සපයන්නන්ට ද විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කල හැක. ස්වයංක්‍රීය ටිකට්පත් භාවිත කරන මගීන්ට විශේෂ දිරිගැන්වීම් ලබාදීම තුලින් මගීන් මේ සඳහා උනන්දුකිරීමට බස් හිමියන්ට හැකිවේ. සමීප පරාස සංනිවේදනය සක්‍රීය කල සිම්පත් පාවිච්චි කරන ග්‍රාහකයන් සඳහා තවත් විවිධ (ඇමතුම් නොවන) පහසුකම් පිරිනැමීමේ වැඩසටහන් තුලින් ග්‍රාහක සංඛ්‍යාව ඉහල නංවා ගැනීමට ජංගම දුරකතන සේවා සපයන්නන්ට අවස්ථාව ලැබේ.

මෙවැනි සේවයක් තුලින් රජයට අත්වන වාසිය ද සැලකිල්ලට ගත යුතුය. ප්‍රවාහන සේවා සඳහා දැනට සැපයෙන ඉලක්කයක් නොමැති සහන සැපයීම වෙනුවට එම සහන ලැබිය යුතු සමාජ කොටස් වලට ඉලක්කගතව සහන සැපයීමේ හැකියාව මෙතුලින් රජයට ලැබෙනු ඇති අතර ඒ හරහා විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට ද හැකි වනු ඇත.

## නිගමනය

ස්වයංක්‍රීය බස් ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම මගින් ආර්ථික සමාජ පිරමීඩයේ පහළම ස්ථරය වන රටේ අඩු ආදායම් ලබන පොදු ජනතාවට ද වාසි සැලසේ. කෙසේ වුව ද ඕනෑම වෙනස් වීමක් පිළිබඳව මුලදී සැක පහළ කිරීම සහ එයට නොකැමති වීම සමාජයක සාමාන්‍ය ක්‍රමයයි. එබැවින්, නිර්මාණාත්මක දිරිගැන්වීමේ වැඩසටහන් හරහා ජනතාව අතර මෙම ක්‍රමය ප්‍රචලිත කිරීමට බස්රථ ප්‍රවාහන සේවා සපයන්නන්ට සාමූහික ප්‍රයත්නයක් දැරීමට සිදු වනු ඇත.

---

ආචාර්ය හර්ෂ ද සිල්වා
0777 686 897 harsha@lirneasia.net

ආචාර්ය රොහාන් සමරජීව
0777 352361 rohan@lirneasia.net